


# අභිධර්මාර්ථ සංග්‍රහශුද්ධිය

# අභිධර්මාර්ථ සංග්‍රහ ශුද්ධිය

හෙවත්

බුරුම සිංහල අභිධර්මාර්ථසංග්‍රහ පොත්හි චිරකාලාගත

අශුද්ධපාඨ ශුද්ධකරගතයුතු ක්‍රමයයි.

අභිධර්මාර්ථසංග්‍රහය පුහුණුකරණ සියලු ආධුනිකයන් විසින්

භා වි තා ක ට යු තු යි

“ලක්මිණිපහන්” කතෘ ධුරය දරණ

ඇම්. ධර්මරත්න විසින්

සකස්කරණලදී.

කොළඹ

1893

# අභිධර්මාර්ථසංග්‍රහශුද්ධිය

**නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස.**

පුරාතන අභිධර්මයෙහි පරතෙරපත් ශ්‍රෙෂ්ඨාචාර්‍ය්‍යවරයන්ගෙන් ලක්දිව අශූන්‍යව පැවතිබවට සාක්ෂිය අභිධර්මපිටකයට පිටිවහල්වූසියලු අර්ථකථා ටීකානුටීකා ග්‍රන්ථිපදදීය ලංකාවීපවාසිවූ පුරාතන ආචාර්‍ය්‍යවරයන්විසින්ම ලියනලද්බවයි. අභිධර්ම අටුවාලී බුද්ධඝොසාචාරීන්වහන්සේ දක්ෂිණඉන්දියාවෙන්. ලක්දිව් පැමිණ අනුරාධපුරයෙහිවැඩවසමින්අටුවාලීසේකා. මූලටීකාසච්චසංඛෙපකාර ආනන්දවනරතනමහාස්වාමිපාදයෝලංකාවේම ඉපිදලංකාවේමවිසූකෙනෙකි. විභාවිනීටීකාවිකාසිනීටීකාකාර සුමඟලමහාස්වාමිපාදයෝද අභිධර්මාර්ථසංග්‍රහසන්නකාර ශාරිපුත්‍ර මහාස්වාමිපාදයෝද එසේම ලංකාවාසිහුමැයි. අභිධර්මඅනුටීකාපරමාර්ථ මඤ්ජුෂාටීකාරූපාරූපවිභාගකාරධම්මපාලමහාස්වාමිපාදයෝනාගපට්ටනමේවිසූදක්ෂිණඉන්දියාවාසිකෙනෙකි. අභිධර්මාර්ථසංග්‍රහපරමාර්ථවිනිශ්චය නාමරූපපරිච්ඡෙදකාර අනුරුද්ධමහාස්වාමිපාදයෝ දක්ෂිණඉන්දියාවේ කාවේරිපටුනේ ඉපිද කාංචිපුරයෙහි විසූ කෙනෙකි. අභිධර්මාවතාරකාර උරගපුර බුද්ධදත්ත මහාස්වාමිපාදයෝ නාඹරුවෙහි විසූකෙනෙකි. මුන්වහන්සේලා සියලුදෙනම ලංකාදක්ෂිණඉන්දියාදෙකේවිසූනුමුත් සුවිශුද්ධමහාවිහාරපරම්පරාගත විශිෂ්ට ග්‍රන්ථකර්තෘවරයන්බවපෙනේ. මුන්වහන්සේලා පොත්නොලිවාහුනම් පශ්චිමකාලිකයන්ට මේපිටකයෙහි කිසිදුඅර්ථයක් දැනගත නොහැක්කේය. එහෙයින්චිරකාලාතීතවූ මුන්වහන්සේලාගේ නම්වලට ශාසනාන්තර්ධානයදක්වා නමස්කාර කටයුතුයි. සියාම් බුරුමදෙශවාසීන් අභිධර්මය පුහුණුකලේමේපොත්වල උපකාරයෙන්ම බැවින් ඔවුහු මුන්වහන්සේලාගේනම්වලට අදදක්වා නමස්කාර කරති. ලක්දිව පරරාජවශප්‍රාප්තවීමෙන්පසු මදින්මද ශාසනය පිරිහීයාම හෙතුකොටගෙණඅභිධර්මපිටකයද පිරිහීමටගොස්තිබි වර්තමාන කාලයෙහි ආධුනිකයන්ගේ සිත් අභිධර්මයඉගනීමට නිම්නප්‍රාග්භාරව තිබෙනබවපෙනේ.

අභිධර්මය ඉගනීමට තිබෙන පොත් අතුරෙන් අභිධර්මාර්ථසංග්‍රහප්‍රකරණය ග්‍රන්ථලාඝව අර්ථබාහුල්‍යාදි ගුණාඪ්‍යයෙන්ගා සියලු පරමාර්ථයන් සංක්ෂෙපයෙන්ගතුළුවා සඞ්ග්‍රහකිරීමෙන්ද යුක්තහෙයින් සියලු ශාසනිකයන් අතරම මේපොත පරමාර්ථධර්මාධ්‍යයන ග්‍රන්ථයමෙන් ව්‍යවහාරකාරගනලබනබැවින් අපරටේ උගත්ස්ථවිරදෙනමක්විසින්ශුද්ධකොටමුද්‍රණ

යකරවනලද්දේය. එසින් විද්‍යොදයපිරිවෙණආචාර්‍ය්‍යපදප්‍රාප්ත දොඩන්දුවේ දෙවමිත්තස්ථවිරයන් විසින් මුද්‍රණයකරවනලදපොත සන්නිවියුක්තවද මූකලන්ගමුවේ නන්දාරාමස්ථවිරයන් විසින් මුද්‍රණයකරවනලද පොත ප්‍රශ්නෝත්තරසන්නායුක්තවද මුද්‍රණය කරවාතිබේ. නන්දාරාම ස්ථවිරයන්ගේ පොතේ වැඩ අඩාලව තිබියදී උන්වහන්සේ කලුරියකළබැවින් තදනුවර්ත්තනයන්ගේ අයදමෙන් අගකලාපයෙහි සිඩිපත්‍රබලාදීමෙන්හා සංශෝධනය ලියාදීමෙන්ද අපිත් අවසානයේදී ඒපොතට මදක් සම්බන්ධවීමු. ඊට මත්තෙන්. ඒපොතේ සිඩිපත්‍රාදිය බලාදීමෙන් අඹගහපිටියේ විමලසාර නායක ස්ථවිරපාදයන් විසින් උපකාර කරණලදැයි දැනගතිමු. දෙවමිත්තස්ථවිරයන්ගේ පොත ආචාර්‍ය්‍ය ශ්‍රීසුමංගල නායකස්ථවිරපාදයන්ගේහා ආචාර්‍ය්‍ය ශ්‍රීදෙවරක්ෂිතයන්ගේත් උපදෙස්ඇතුව සිංහලබුරුම සියම් ආදී බොහෝ පොත්වලට සමකරබලා ශුඩකරණලදැයි සංඥපනාදියෙන්පෙනේ. එතකුදුවුවත් මේ පොත්දෙකේම අශුඩවූ විරුඩපාඨ බොහෝසේ දක්නාලැබෙනහෙයින් ආධුනිකජනයාගේ ප්‍රයෝජනයසඳහාම අර්ථවෛපරීත්‍යයට හේතුවූ පාඨයන් පමණක් ශුඩකරගතයුතුක්‍රමය මෙහි දක්වන්නෙමු. අපේ මේප්‍රයත්නය ඒ ග්‍රන්ථශෝධක උගත් ස්ථවිරවරයන්ට හෙළාදක්නා අදහසින් නොව ආධුනික ජනයාගේ මුළානොවීමපිණිසමබව දැනගතයුතුයි. කොයිපොතක්වුවත් වරක්දෙකකට සම්පූර්ණයෙන් ශුඩකරනොගතහැකිබව මෙබඳු කාර්‍ය්‍යයන්ගේ පරිශ්‍රමදන්නවුන්ට අතමිලක්සේ වැටහේමැයි පරමගම්භීර පරමාර්ථධර්මසම්බන්ධ ප්‍රකරණ ශෝධනයෙහිවූකලී පෘථග්ජනාවෙනිකස්වභාවධර්මයක්වූස්මෘතිවිප්‍රවාසයෙන් එබඳු දෙය් ඇතිවීම ආශ්චර්‍ය්‍ය නොවේ අප විසින් ආධුනිකජනයාකෙරෙහිකරුණාමෛත්‍රීපුරස්සරව්‍යාපාරයෙන්හා ඒකාන්ත ශාසනාලයෙන්ද දක්වනතැන් ඒපොත ග්‍රහණධාරණය කරන්නවුන්විසින් නැවතනැවතත් පරීක්ෂාකොට යථා ධර්මශාසනානුලොම විනම් ශුඩකර ඉගණීමෙන්හා නැවත මුද්‍රණයේදී සකස්කොට මුද්‍රණය කරගැනීමෙන්ද සසුන් වැඩවඩත්වයි ආසිංසනයකරම්හ.

මේ පොත්දෙක අතුරෙන් දෙවමිත්තස්ථවිරයන්ගේ පොතවැඩිදෙනාඅතර ප්‍රචලිතව තිබෙනහෙයින් ඒපොතේ පිටු පේළි ඉලක්කම් දක්වමින් පොත්දෙකේම නොසකස්තැන් සකස්කරගතයුතුක්‍රමය දක්වන්නෙමු. තවද බුරුමසිංහල අත්කුරුපොත් තිහහතලිහක් පමණද මුද්‍රිතසිංහල පොත් දෙකක් සහ මුද්‍රිත බුරුම පොත්පහක් පමණද අපට දකින්නට ලැබුනේය ඒ සියලු පොත්හිම ඇතම්පාඨ ඒකාකාර අශුඩව තිබේ සිංහලපොත්හි පරම්පරාගතව එන ඇතම්

ශුද්ධපාඨ බුරුම්පොත්හි අශුද්ධවද බුරුමපොත්හි පරම්පරාගතව එන
ඇතම් ශුද්ධපාඨ සිංහලපොත්හි අශුද්ධවද දක්නාලැබේ එහි විනිශ්චයද
මෙහිපහළවේ. ප්‍රකෘතිවිසම මාර්ගයකට අදුරුවැටීමෙන් ඒමාර්ගය ද්විගු
ණත්‍රිගුණව විසමවන්නාක්මෙන්නානානයනිපුණපරමවිචිත්‍රගම්භීර
ප්‍රමාණාතීතධර්මප්‍රකරණයක් දෙශාකිරීමෙන් ද්විගුණත්‍රිගුණව දුර්බොධ
වනබව කුමට කියමුද? අපේමේ දෙශාපහරණ පූර්වක ශුද්ධය මේ අභිධ
ර්මාර්ථසංග්‍රහයටලියනලද දිඹුලාගලකාශ්‍යප මහාස්වාමිපාදයන්ගේ පුරා
ණටීකාවද සුමංගල මහා ස්වාමිපාදයන්ගේ විභාවිනිටීකාවද සද්ධම්මජෝ
තිපාල මහාස්වාමිපාදයන්ගේ සංඛෙපවණ්ණනාටීකාවදයන ප්‍රශස්තටී
කාත්‍රයහා අටුවාවද ආශ්‍රයකොටගෙණ ලියනබව දතයුතුයි.

ග්‍රන්ථාරම්භයෙහි 1–2 වෙනි ගාථාවය ශුද්ධකිරීමේදී පුරාණසිංහල බු
රුම සියලු පොත්හි තිබිගිය "අභිවාදිය" "වතුධා" යන පදවය "අභි
වඤ්ඤිය" "වතුධා"යි වෙනස්කිරීමෙන් කුමනප්‍රයොජනයක්වීදැයි නො
හැගේ. "භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අඤාසි" යනාදීන් ආ සි
යගණන් පාලිපාඨයෙහි මේ ක්‍රියාව අසංයොගවම දක්නාලැබේ. ප්‍ර
කාරාර්ථයෙහි ධාප්‍රත්‍යයෙන් නිපන් "විධාතිධාවතුධා"යනාදිය "තෙධා
සඞ්ඛවතුධා පදමපිවතුධා පවධානාමිකම" යනාදීන් ඡන්දොවෘත්තිභ
ඞ්ගනිවත්තියපිණිස කලාතුරකින් සංයොගවෙතත් අන්කිසිතැනෙ
කා සංයොගකිරීමට යුක්තියක් නොමැත්තේය මේ රූපසිද්ධිගාථා පාද
යෙහි ධාප්‍රත්‍යය සංයොගවත් අසංයොගවත් යෙදූනු පරිදිකල්පනාකා
ටයුතුයි. එනකුදුවුවත්අර්ථවෛපරීත්‍යයටමෙයින්හෙතුනොපැණෙනබැ
වින්සුබොධවාරණයටහා කොමලත්වයට පමණක් බාධාවූ පෙනේ.

1 වෙනිපිටේ 10 පෙළේ 'තත්ථචිත්තං. තාවචතුබ්බිධංහොති' යි සිය
ලුපොත්හි ආ පාඨය වෙනස්කොට "තත්ථචිත්තංතාව චතුබ්බිධං"යි
ශුද්ධකරතිබේ. "තත්ථ තෙසුචතුසුඅභිධම්මත්ථෙසු තාව පඨමංනිද්දිට්ඨං
චිත්තං කාමාවචරං රූපාවචරං අරූපාවචරං ලොකුත්තරවෙනි භෙ
දෙන චතුබ්බිධංහොති තත්ථාති නිද්ධාරණසමුදයො චිත්තන්ති නිද්ධාර
ණීයං. තාවනිද්දිට්ඨන්ති නිද්ධාරණහෙතු. නිද්ධාරණංපන ක්‍රියා" යනුසං
ඛෙපවණ්ණනාටීකාපාඨයි. මෙහිසම්බන්ධයදක්වා තත්ථ යනපදය නිද්ධාර
ණසමුදය හෙවත් නිදරණධර්මසමූහයයිකියාද චිත්තය නිදරියයුතු ධර්
මයයිකියාද තාවයනපදය නිදරීමට හෙතුයයිකියාද හොතියනක්‍රියාව
නිදරීමයයිද කරණලද අර්ථවිවරණයෙන් අනුරුද්ධාචාර්ය මහා
ස්වාමිපාදයන්ගේ රචනාව ක්‍රියාවසමගයයිනිසැකවහැගේ ක්‍රියාවනො
යෙදුවානම් නිද්ධාරණ සමුදයනිද්ධාරණීයනිද්ධාරණහෙතුය නිද්ධාරණය
යන අර්ථචතුෂ්කය කොයින්ලැබේද? එහෙයින් "හොති" යන ක්‍රියාව
සමගම පුහුණුකළයුතුයි–

එමපිටේ 20 වෙනිපෙළේ "ඉමානි චෙපි පටිඝසම්පයුත්තචිත්තානිනා
ම" යන්න "සම්පයුත්ත" ශබ්දය අත්හැර "පටිඝචිත්තානි" යිශුද්ධක
රතිබේ "දෙසොයෙව හිපටිඝොති කත්වාපටිඝසම්පයුත්තානීති වුත්තානීති
පටිඝස්සදෙමනස්ස වෙදනාය සහචරිත භාවදස්සනත්ථං වුත්තානී"ති ය
නු සංඛෙපවණ්ණනායි. "පටිඝසම්පයුත්තභාවොපනලබ්භිතානංඑකන්ත
සහචාරිතා දස්සනත්ථං වුත්තොති දට්ඨබ්බං" යනු විභාවිනිටිකායි ප්‍රතිඝ
යකියන්නේත් වෙඝයටමනම් ප්‍රතිඝසම්ප්‍රයුක්තබව කුමක්සඳහාකි
යනලද්දයත්? ප්‍රතිඝය දෙම්නසහා එක්වපවත්නාබව දක්විමටයයි
දතයුතුයි යනමේ ටීකාමතපරිද්දෙන් අනුරුද්ධාචාරීන්වහන්සේ විසින්
"පටිඝසම්පයුත්තචිත්තානි" යිරචනාකළබවට සැකකොයින්ද? ඇත
මිවිට මින්මතුකියනමොමුහචිත්තනිගමනයේදි සම්පයුත්තශබ්දය නො
යොද "ඉමානිචෙපිමොමුහචිත්තානිනාම" යි කිවේකුමක් නිසාදැයිප්‍රශ්න
කටයුතුවතිබේ. ශුද්ධමොහමූලිකචිත්තවය වනාහි මූලාන්තරවිරහිත
බැවින්ද "මොහෙනමුය්හන්තිමොමූහානි" යනු විග්‍රහබැවින්ද එසේ
කියයුතුවුවත්ප්‍රතිඝසම්ප්‍රයුක්තචිත්තවය ද්විමූලිකබැවින් ප්‍රතිඝචිත්තයයි
නොකියයුතුබව දතයුතුයි.

8 පිටේ අටගැනෙක "සම්පටිච්ඡනචිත්තං" යනාදිය "සම්පටිච්ඡනංසන්
තීරණංහසිතුප්පාදං පඤ්චද්වාරාවජ්ජනං මනොද්වාරාවජ්ජනං "යනුවෙන්
"චිත්ත" ශබ්දය අහක්කර ශුද්ධකරතිබේ "තත්‍රකතමංකාමාවචරං" ය
නාදිය පටිනිද්දෙසයි පටිනිද්දෙසයෙහි චිත්තනාමයසම්පූර්ණයෙන්දක්
වියයුතුයි මේචිත්තපරිච්ඡෙදයෙහිසම්පූර්ණනම් නොදක්වීමෙන් මතු
අර්ථාවබොධයට බාධාපැමිණේ "සම්පටිච්ඡනං" යනාදිනාමමාත්‍රයෙ
න් පිළිගැනීම්ආදිකෘත්‍යමාත්‍රයක්ම වාචකවනබැවින් මතුකෘත්‍යසංග්‍ර
හයටනම් මෙසේ යෙදේ මහාසතිපට්ඨානඅටුවාහි "භවඞ්ගාවජ්ජනංචෙ
ව දස්සනංසම්පටිච්ඡනං සන්තීරණංවොට්ඨපනං ජවනංභවති සත්ත
මං" යනුවෙන් ඒ ඒ චිත්තයන්ගේ කෘත්‍යමාත්‍රයක්මුත් චිත්තය නොකි
යේය. මේ ෂඩ්ද්වාරිකවීථියෙහි නියමයෙන් ජවන්සතක් උපදිනබැවින්
චිත්තය සඳහානම් "සත්තමංජවනං,යිනොකියා 'ජවනානිභවන්ති'"යිකි
යයුතුවේ මේපරිච්ඡෙදයෙහි "තත්‍රචිත්තංතාව" යනපටන්ගැන්මහා
'චිත්තසඞ්ගහවිභාගො'යනනිගමනයත්සිතතබාගත්තානම්චිත්තය හැ
ඟෙනචිත්තවිශේෂණශබ්දයක්යෙදියයුතුබවපෙණේ.ටීකාවේමෙතන්හි
චිත්තශබ්දය නොයොද අර්ථවර්ණනාකළේ චිත්තශබ්දයේඅර්ථයටනිබැ
ඳුන්හායටවර්ණනානොකළඅනුත්තානපද වර්ණනාවබැවිනැයිදතයුතු
එහෙයින්සියලු බුරුම සිංහලපොත්හි පුරාණපටන්ආ "සම්පටිච්ඡන
චිත්තං" යනාදිය අනුරුද්ධාචාරීන්වහන්සේගේම රචනාව බවදතයුතු

7 වෙනි පිටේ 1-2 පෙළේ "සත්තිමෙ චෙතසිකා සබ්බේසුපි එකූනනවුතිචිත්තුප්පාදෙසු" යන පාඨයෙහි, ඉම, පි, ශබ්දවය විරුද්ධපාඨ සංඛ්‍යාව වශෙන අත්හැර "සත්තචෙතසිකා සබ්බෙසු" යි ශුද්ධකරතිබේ. මේ පාඨයට ටීකාකරණ අඹුලාගල මහාකාශ්‍යප ස්වාමිපාදයන් විසින් "ඉමෙ සත්තපි සබ්බෙසු එකූනනවුතියා චිත්තෙසු නිස්සෙසෙන උප්පජ්ජනතො සබ්බචිත්ත සාධාරණා නාම" යනුවෙන්, ඉමශබ්ද, පිශබ්ද දෙකම ඇතුළත් කොට සම්බන්ධය දක්වා තිබෙන බැවින්ද මෙම අධිකාරයෙහි සෙසු තැන්වල ඉමශබ්දය අත්හැර සුද්ධකර තිබෙන බැවින්ද ඒ ශබ්ද දෙක යෙදීම ශුද්ධපාඨ බව හැඟේ. මෙම අධිකාරයෙහි අකුසලසංග්‍රහයෙහි "සබ්බෙපි තෙය්‍යපි සඞ්දෙන චාදස අකුසලචිත්තානි සම්පිණ්ඩිත්වෙන ඉමෙහි චතුහි චෙතසිකෙහි විනිම්මුත්තං කිඤ්චි අකුසලචිත්තං නත්ථීති දස්සෙති,, යනු සංඛෙපවණ්ණනායි. ඒ පරිද්දෙන් මෙහිත් පිශබ්දය සම්පිණ්ඩනාර්ථයි. එහෙයින් මේ චෙතසිකසතෙන් මුක්තවූ කිසි චිත්තයක් නැතැයන බව දක්වයි.

එම පිටේ 7 වෙනි පෙළේ "ඡසට්ඨිචිත්තෙසු ජායති" යන තැන 'ජායති' යන් නැවැඩිසි මීටමුලින් තිබෙන "පඤ්චපඤ්ඤාසවිත්තෙසු උප්පජ්ජති" යන්නෙන් ක්‍රියාව මෙතනට අනුවර්තනය වේ. ඊට සාක්ෂිය "ඡසට්ඨිචිත්තෙසු විචාරො පන උප්පජ්ජතීති යොජනා" යන පුරාණටීකාවචනයි.

එම පිටේ එම පෙළේ "ද්විපඤ්චවිඤ්ඤාණ විචිකිච්ඡා(සහගත) වජ්ජිතචිත්තෙසු" යන්න "විචිකිච්ඡාවජ්ජිතචිත්තෙසු,, යි 'සහගත,ශබ්දය අත්හැර ශුද්ධකරතිබේ "ද්විපඤ්චවිඤ්ඤාණෙහි විචිකිච්ඡාසහගතෙනචාති එකාදසහි වජ්ජිතෙසු අවසෙසානි චිත්තෙසු අධිමොක්ඛො ජායති,, යන විභාවිනිටීකාපාඨයෙන් සහගත ශබ්දය ඇතුළුවම අනුරුද්ධාචාරීන් වහන්සේ රචනාකළ බව හැඟෙනවාත්හැර විචිකිච්ඡාශබ්ද වජ්ජිතශබ්දදෙක මධ්‍යයෙහි සහගතශබ්දයහෝ චිත්තශබ්දයහෝ නොයෙදුවොත් කෙවල විචිකිච්ඡාව මිස තත්සම්ප්‍රයුක්තචිත්තය නොහැඟේ.

එසේවිනම් එම පිටේ 11 වෙනි පෙළේ "ඡන්දඅහෙතුකමොමූහවජ්ජිතචිත්තෙසු,, යන තැන "මොමූහවජ්ජිත" කිවේ මක් නිසාදැයි ප්‍රශ්නයක් වියුතුව තිබේ. "මොහෙන මුය්හතීති සම්මුය්හතීති මොමූහං චිත්තං,, යනු නිර්වචනබැවින් මධ්‍යහකාරලොපයෙන් මොමූහශබ්දය නිෂ්පන්න බැවින් සහගතචිත්ත ශබ්දයන් නොයොදා මොමූහශබ්දය තමාවිසින්ම සිත කියනුලැබේයුයි. ශබ්දාන්තරාපෙක්ෂාවක් නැතැයි දතයුතු. මේ පාඨයෙහිම අගයොදා තිබෙන 'ලබ්භති' යන ක්‍රියාව මුලින් අනුවර්තනය වනබැවින් මෙතනට යෙදීමත් අධිකයි.

එම පිටේ 29 පෙළේ "එකූනවීසති මෙ චෙතසිකා,, යනාදියෙහිත් ඉමශබ්දය හැර ශුද්ධකර තිබෙනනුමුත් මේ අධිකාරයෙහි පුරාණපොත්වල තිබිණිය ඉමශබ්දසියල්ලම අනුරුද්ධාචාරීන් වහන්සේගේම රචනාව බව පුරාණ ටීකාවචනයෙන් දතයුතු.

8 වෙනිපිටේ 19 පෙලේ“ඉස්සාමච්ඡෙර කුක්කුච්චවිරතිකරුණාදයො,,යන එකම සමාසාන්තපදය“ඉස්සාමච්ඡෙර කුක්කුච්චාවිරතිකරුණාදයො,,යිසමාසදෙකක් කොට ශුද්ධකිරීමත් නුසුදුසුයි අනුරුද්ධාචාරීන්වහන්සේ නානාභාවයෙන් සමානවූ මේසියළු ධර්‍මයන් එකම අසමාහාරද්වන්ද්ව සමාසයෙන් කීබව“ඉස්සාමච්ඡෙරකුක්කුච්චවිරතිකරුණාදයො නානාකදාචිජ්ජයනහි,, යන විභාවිනිටීකාපාඨයෙන්ද “ඉස්සාමච්ඡෙරකුක්කුච්චවිරතිකරුණාදයො නානාරම්මණානියතානානානුක්කා කදාචිජ්ජායන්ති,, යන සංක්ෂෙපවර්ණනාටීකාපාඨයෙන්ද පෙනේ “ඉස්සාමච්ඡෙරකුක්කුච්චානි ච විරතිවකරුණාදිච ඉස්සාමච්ඡෙරකුක්කුච්චවිරති කරුණාදයො,,යනුවෙන් අනුරුද්ධාචාරීන්ගේ රචනාව පරිද්දෙන් විග්‍රහ දක්වා නැවත“ඉස්සාමච්ඡෙර කුක්කුච්චාවිරති කරුණාදයො තිපිපාඨො,,යන සංක්ෂෙපවර්ණනා ටීකාවචනයෙන් ඒ පාඨාන්තරයක් බවදපෙනේ නුමුත් එකම සමාසයබව සියලුදෙනාවිසින් පිළිගත්බවපෙනේ.

9 පිටේ 12 පෙලේ“අප්පමඤ්ඤායොච,,යන්න “අප්පමඤ්ඤාච,,යි කළශුද්ධියත් නොමැනවි “අප්පමඤ්ඤා,,යී එකවචනබහුවචන දෙකටම සාධාරණ බැවින් එකවචන සංඥනුපදිනපිණිස සියලුපොත්හිම බහුවචනයෙන් යෙදීම උචිතයි“අප්පමඤ්ඤායොන ලබ්භන්තීති මහග්ගතෙ අප්පමඤ්ඤාවයස්සසොමනස්ස සහගතත්තානප්පවත්තමජ්ඣාතෙස ඤාවො,,යන සංක්ෂෙපවර්ණනාපාඨයෙන් සැකහළයුතුයි.

10 වෙනි පිටේ 18 පෙලේ“විචිකිච්ඡාසහගතා,,යන්න “විචිකිච්ඡාසහිතා,,යි ශුද්ධකරතිබිමත් නොමැනවි. අභිධර්මයෙහි කිසිතැනක චිත්තචෛතසිකයන්ගේ එකොත්පාදදි සතර ලක්ෂණයෙන් සම්බන්ධභාවය පෙන්වීමපිණිස සම්පයුත්ත සහගත ශබ්දවයෙන් මිස සහිත ශබ්දයෙන් නොදක්වයි සම්පයුත්ත සහගත ශබ්දයන්ගේ අර්ථයත් සහිත ශබ්දයේ අර්ථයත් ඉතාදුරයි එහෙයින් අනුරුද්ධමහාස්වාමීපාදයන්විසින්සහිතශබ්දයමේස්ථානයෙහි නොයොදන බව දතයුතුයි.

11 වෙනිපිටේ 4 වෙනිපෙලෙ “ඉතිවිත්ථාරතො වුත්තානෙත්තිංසවිධසඟහා,,යනශුද්ධියත් නොමනාවේ. මෙහි බහුවචනයෙන්තෙතිස්ප්‍රකාරසංග්‍රහයන් බොහෝගණනක් ඇතිබවකියයි විභාවිනිටීකාවේ“තෙත්තිංසවිධසඟහොති අනුත්තරෙ පච්චත්ථාමග්ගහතෙ කාමාවචරසොභනෙවාදසඅකුසලෙසත්ත අහෙතුකෙචත්තාරොති තෙත්තිංසවිධසඟහො,, යනපාඨයෙන් තෙතිස්වැදෑරුම්සංග්‍රහයඇත්තේ එකක්මබව පෙනේ එහෙයින් පුරාණපොත්හි ආක්‍රමයට“ඉති විත්ථාරතො වුත්තොතෙත්තිංසවිධසඟහො,,යන පාඨයම ශුද්ධබව සැලකියයුතුයි. මීටමුලින් ආ ගාථාවේ “චතුබ්බිධොසඟහො,,යන්නම මීට සාධකවේ.

එම පිටේ 14 පෙළේ "සුඛං දුක්ඛං අදුක්ඛමසුඛං,, යි අනුරුද්ධාචාරීන්වහන්සේගේ රචනාව වෙනස්කර "අදුක්ඛමසුඛං,, යි ශුද්ධකරතිබේ. මේ "අදුක්ඛමසුඛා,, ශබ්දය සියලුතන්හිම උපෙක්ඛාශබ්දය අපෙක්ෂාකරගන ස්ත්‍රීලිඞ්ගවෙන්ම යොදුහිබේ "දුක්ඛනොසුඛනොව අඤ්ඤා අදුක්ඛමසුඛා මකාරාගමවසෙන,, යනුහා "යථාහිසුඛදුක්ඛානි අඤ්ඤථා කායස්ස අනුග්ගහඋපඝාතඤ්චකරොන්ති අඤ්ඤථා මනසො නෙවං උපෙක්ඛා නෙව සා එකධාවදෙසිතා,, යනුද විභාවිනිටීකාපාඨයි 'අඤ්ඤා-සා-දෙසිතා' යන ස්ත්‍රීලිඞ්ගික වචනසමුදායෙන්ම අදුක්ඛමසුඛාශබ්දය ස්ත්‍රීලිඞ්ගික ශබ්දය බවම හැඟේ. යම්සේ සැපදුක් දෙදෙන ශරීරයට අනික් ප්‍රකාරයකිනුත් සිතට අනික් ප්‍රකාරයකිනුත් උපකාර අපකාර කෙරෙද්ද උපෙක්ෂාව එසේනො කරණහෙයින් ඒ උපෙක්ෂාව එක් ප්‍රකාරයකින්මදෙශනාකරණලද්දේය. එහෙයින් මේ ශබ්දත්‍රය සමානලිඞ්ගික නොවන බවදූන පුරාණ නිබිගිය අදුක්ඛමසුඛාශබ්දයම ශුද්ධපාඨයබව සැලකියයුතු.

14 වෙනිපිටේ 16 පෙළේ "ධාරවිමුත්තානවපන,, යන්නෙහි පනශබ්දය අධිකයි මේ ප්‍රකරණයෙහි පනශබ්දය යොදන්නේ අර්ථාන්තරයක් කියනුකැමති තැනයි යටකීඅර්ථය නිගමනයකරන්ට මත්තෙන් පන ශබ්දය නොයොදනබව දතයුතුයි. එසේම 15 පිටේ 2 පෙළේ "මහග්ගත චිත්තානිපන,, යන තැන පනශබ්දයත් අස්ථානප්‍රයොගයක්බැව් දතයුතුයි.

එමපිටේ 16 පෙළේ "(තථා) අවසෙසාපන,, යන්තැන තථාශබ්දය සියලු බුරුම පොත්හි අත්හැරිතිබේ නුමුත් සිංහලපොත්හි ආක්‍රමයටම තථාශබ්දය දෙවමිත්තාස්ථවිරයන්ගේ පොතේද නොහැරීම මනාබව හැඟේ "තථාහදයංනිස්සායෙව පවත්තන්ති,, යන විභාවිනිටීකාපාඨයෙන්ද 'අවසෙසාමනොවිඤ්ඤාණධාතු සංඛාතාව තථා හදයං නිස්සායෙව පවත්තන්ති' යනපුරාණටීකාපාඨයෙන්ද "තථාඅවසෙසා මනොවිඤ්ඤාණධාතුසංඛාතා ධම්මාව හදයංනිස්සායෙව පවත්තන්තිනම නොධාතුයෙවාති අධිප්පායො,, යන සංඛෙපවණ්ණනාපාඨයෙන්ද තථාශබ්දය ආචාරීන්වහන්සේගේම රචනාවබවහැඟේ.

එමපිටේ 21—22 පේලිවල "ජවනඤ්ච තිවත්ථු,, යනතැන් "ජවනං තිවත්ථු,, යි වියයුතුබව ටීකාත්‍රයෙන්ම පෙනේ.

16 පිටේ 10 පෙළේ "වීථිමුත්තානං පන,, යනපදය බුරුමපොත්හිද ඤාණාරාමතිස්සතෙරුන්වහන්සේගේ පොතේද "ජවීථිමුත්තානං පන,, යිදක්නාලැබේ "පනසද්දෙන යොජෙත්වා වීථිමුත්තානං පන තථාදිමාන වීථිමුත්තානං

නාමකා භූතා වාරප්පවත්තා විත්තප්පවත්තියො යොජෙතබ්බාතිසම්බන්ධො,,යන සංඛෙපවණ්ණනා පාඨයෙන් ජශබ්දයවැඩිපුර එකක් බව ඔප්පුවෙනබැවින් පුරාණසිංහලපොත්හි තිබීගියආකාරයම දෙවමිත්ත ස්ථවිරයන්ගේ පොතටගෙන තිබීම මනායයි හැඟේ.

18 පිටේ 16 පෙළේ “පුථුජ්ජනානසෙක්ඛානං කාමපුඤ්ඤතිහෙතුතො,, යනගාථාර්ධයෙහි “පුථුජ්ජනානං,, යනතන්හි විභක්‍ත්‍යන්ත නිග්ගහිත ලොපය වෙනපොත්හි නැතුවත්හැර ඒලොපයෙන් සිදුවූ අර්ථයකුත්නොපෙනේ “පුථුජ්ජනානඤ්චසෙක්ඛානඤ්චකාමපුඤ්ඤතිහෙතුතොපරං රූපාරූප ලොකුත්තරප්පනාසම්භොන්ති,,යන විභාවිනිටීකා පාඨයෙන් “කාමපුඤ්ඤ තිහෙතු ශබ්දවල එකම සමාසයබවදපෙනේ.

19 පිටේ 1 පෙළේ “පවදන්ති” යනු වැරදියි “ භොන්තීතිපිවදන්ති” යි වියයුතුයි එමපිටේ 20 පෙළේ “භවඟසොතෙ”යනු “භවඟසොතො විය” කියාවියයුතුයි.

එමපිටේ අන්තිමපෙළේ “තථා (සෙක්ඛ) පුථුජ්ජනානං ක්‍රියාජවනානි” යනතැන සෙක්ඛශබ්දය හැරදමා ශුද්ධකරනිබේ “සෙක්ඛපුථුජ්ජනානං ක්‍රියාජවනානි නලබ්භන්ති” යන්නෙහි භාවය සප්තශෛක්ෂයන්ටහා පුහුදුන්ට ක්‍රියාජවන්නූපදියයනුයි “තථාසෙක්ඛපුථුජ්ජනානං ක්‍රියාජවනානි නලබ්භන්ති අප්පහීනතණ්හාමූලකත්තා,,යන සංඛෙපවණ්ණනාටීකාපාඨයෙන් තෘෂ්ණා මුලනැති නොකළවුන්ට ක්‍රියාජවන් නූපදිනබව කියයි· “අබ්ධමහාක්‍රියා කුසලචිත්තගති එවකෙවලංහි තාඛීණාසවානං උප්පජ්ජන්ති කුසලංහිසෙක්ඛ පුථුජ්ජනානං,, යනු අත්ථසාලිනී පාඨයි. සෝවාන්ආදි ශෛක්ෂපුද්ගලයන්ට ක්‍රියාජවන් උපදින බවක් ආගමේ නොපෙනේ එහෙයින් ‘සෙක්ඛ’ශබ්දය අශුද්ධපාඨවශයෙන් අහක්කිරීම මහත් අපරාධ දෙෂයක්බව පෙනේ.

20 වෙනිපිටේ 3 පෙළේ “යථාසකමරියානමෙව,, යන්න බුරුම පොත්හිද වෙනත් සිංහල පොත්හිද “යථාරහමරියානමෙව,,යි තිබේ “අප්පිලොකුත්තර ජවනානි යථාසකං මග්ගඵලට්ඨානං අරියානමෙව සමුප්පජ්ජන්ති,,යනු විභාවිනීටීකාබැවින් “යථාසකමරියානමෙව,,යන්නම ශුද්ධබවපෙනේ සුදුසුපරිච්ඡේදීන්යයි අර්ථගතහොත් ටීකාවට විරුද්ධවන හෙයින්ද සකෘදාගාමී හා සෝවාන්පල සිත නූපදින හෙයින්ද මෙසේමැනවැයි දතයුතු·

21 පිටේ 26 පෙළේ “භවඟං පරියොසානෙචවනං,, යන්න නාඤරාම ස්ථවිරයන්ගේ පොතේ “භවඟපරියොසානෙ,, යි සමාසකරතිබීමත් වැරදියි මෙහිඅර්ථය අකුසලවිපාකසිත අපායේ ප්‍රතිසන්ධියද ඒ පිළිසිඳ ගත් භවයේ දිවිඇතිතාක් භවාඞ්ගද කෙළවර චුතියදවේයනුයි. ‘ භවඟ පරියොසානෙ” යිකිවොත් භවාඞ්ගයාගේ අන්තයෙහියයි අර්ථගැනෙනබැවින් දෙවමිත්තස්ථවිරයන්ගේපොතේ ශුද්ධයමනාවේ.

22 පිටේ 3 පෙළේ "කාමාවචරපටිසන්ධිවෙච සහනංගවජ්ජනි" යන්නෙහි "සහගං" යනු "සඞ්ඛ්‍යං" වියයුතුයි ඒපදයට පුරාණටිකාවේ "සඞ්ඛ්‍යංවොහාරං ගච්ඡන්"යී අර්ථකියාතිබෙනබැවින් "සඞ්ඛ්‍යං"යි වියයුතුමවේ.

එමපිටේ 11 පෙළේ "පරනිම්මිතවසවත්තීනං දෙවානං (ආයුප්පමානං)" යනතැන "ආයුප්පමාන"ශබ්දය වැඩිවිතිකේ මීටමුලින් "චාතුම්මහාරාජිකානං" යනාදියෙහිආ "ආයුප්පමාන" ශබ්දය "තාවතිංසානං" යනාදියට අනුවර්තනයවූවාක්මෙන් මෙතනටත් අනුවත්තනය වෙ "තතොචතුග්ගුණං පරනිම්මිතවසවත්තිනානං දිබ්බානිසොළසවස්සසහස්සානි" යනු විභාවිනිටිකායි. මින්මතු "සොළසකප්පසහස්සානි ආයුප්පමානං-චතුරාසීතිකප්පසහස්සානි ආයුප්පමානං" යනදෙතැනටත් මුලින්ම අනුවත්තනය වනබැවින් ආයුප්පමානශබ්දය මේ දෙතැනත් වැඩිවිතිබේ.

23 පිටේ 24 පෙළේ "සෙසානි චත්තාරි තිමූලෙහි සම්භවන්ති" යනපාඨයේ සියලු බුරුමපොත්හිද ටිකාහිද එකාකාර වැරදඅතැනක් පුරාණසිංහලපොත්හි ශුද්ධපාඨයක උපකාරයෙන් දෙවමිත්තාසථවිරයන්ගේපොතේ නිවැරදිව යෙදෙන්ට ලංවිතිබේ. අපට දකින්ට ලැබුනු බුරුම සියම් අභිධම්මාථසංග්‍රහ සියල්ලේද සියලු විභාවිනි ටිකාවලද "සෙසානිචත්තාරිපි වීහිමූලෙහි සම්භවන්ති" කියාම දන්නනට ලැබුනේයි. මේ වාක්‍යයෙහි මුළුඅදහස අදත්තාදානාදි සෙසුඅකුසල් සතර දෙවමිත්තාසථවිරයන්ගේ ශුද්ධයේ ප්‍රකාර ත්‍රිමූලයෙන්ද බුරුමපොත් ආදියේ හැටියට දෙමුලකින්ද හටගන්නාබවයි මෙහි දකවන්නේ ඒ ඒ අකුශලචිත්තසම්ප්‍රයුක්ත හෙතුධම්වූ ලොභවෙෂමොහයන්නොවජ්ජවිත්තායන්ගේ ඉපද්මට මූල කාරණවූ නානාක්ෂණික ධම්මබව සිහියේතබාගතයුතුයි. ත්‍රිහෙතුක අකුසල් නැතිබැවින් මේ ත්‍රිමූලයෝඑකාවට ලැබෙන්නාහුදනොවෙති "ලොභොනිදනං කම්මානංසමුදයාය 'ලොභොඅකුසලමූලං, කිසුත්තනියාවෙන්එකඑකධම්මයම නිදනවශයෙන් මුල්වනබව මෙහි කිබව හැගේ එහෙත් ශුද්ධමොහමූලිකදෙසිතහැර ඉතිරි දශාකුසල් සිත් විහෙතුකබව සලකාබුරුමාදිපොත් සියල්ලෙහිම "විහිමූලෙහි සම්භවන්ති,,යි පසුව අපරීක්ෂාවෙන් කළ සංස්කාරයකැයි පෙනේ අකුශලචිත්ත සම්ප්‍රයුක්තධම්යන් සඳහානම් මූලශබ්දයෙන් නොකියා හෙතුශබ්දයෙන් කියයුතුවේ මේගැණ විභාවිනිටිකාවේ දක්වාන්බෙන විස්තර මෙසේය "සෙසානිචත්තාරිපි වීහිමූලෙහි සම්භවන්තිහියො තාව අභිමතංවත්ථුං අනභිමතංවා අත්තබන්ධුපරිත්තාණාදිපයොජනං සඞ්ඛාය හරතිතස්සඅදින්නාදානං ලොභමූලෙනහොති වෙරනියාතනත්ථං හරතොස්ස දෙසමූලෙන තීනිපාඨකාදමාණ

හොදුට්ඨනිග්ගණ්හණත්ථං පරසන්තකං හරන්තානං රාජූනං බ්‍රාහමණාන
චසබ්බමිදං බ්‍රාහමණානං රාජූහිදින්නං තෙසංපන සබ්බදුබ්බලභාවෙන
අඤ්ඤෙහිපරිභුඤ්ජන්තිඅත්තනාසන්තකමෙවබ්‍රාහමණාපරිභුඤ්ජන්තීතාය
දිනි වත්වා සකසඤ්ඤාය එවයංකිඤ්චිහරන්තානං කම්මඵලසම්බන්ධාපවා
දිනාමමොහමූලෙන එවංමුසාවාදදීසු පි යථාරහංයොජෙතබ්බං,, යනු
යි මෙහි “තිහි මූලෙහි,, යීපටන්ගැන්ම තිගමනයෙන් වරදබවපෙනේ
සෙසු අකුසල් සතර දෙමුලින් හටගන්නාහුය යනමෙහි භාවය මෙසේ
යි යමෙක් පළමුකොට කැමති වස්තුවක්හෝ නොකැමැති වස්තුවක්
හෝ තමාගේවත් නෑයන්ගේවත් ආරක්ෂාකිරිමාදි ප්‍රයොජනයක්
සඳහා පැහැර ගනීද ඕහට අදින්නාදානය ලොභමූල නිදානයෙන්වේ;
වෛරයක් පිරිමසනපිණිස පැහැරගන්නාහට ද්වෙෂමූලනිදානයෙන්
වේ නීතිශාස්ත්‍රයෙහි දුෂ්ටයන්ටනිග්‍රහකරණුපිණිස ඔවුන් සතු වස්තු
ව පැහැරගතයුතුයයිකී අසත්‍යපාඨයම ප්‍රමාණකොටගෙනවත්නීතිශා
ස්ත්‍රයේ කීහෙයින් නිවරදියයිසිතාදුෂ්ටනිග්‍රහය පිණිස අන්සතු වස්තුව
පැහැරගන්නා රජුන්ටද මේසියල්ල රජුන්විසින් බමුණන්ට පුදනලද්
දේය නුමුත් බමුණන් හැමටදුර්වලහෙයින් බමුණන්ගේ වස්තුව අනු
න් ප්‍රයොජන විඳිනාහුයයනාදියකියා තමාගේය යනසංඥාවෙන්
යමක් පැහැරගන්නා බමුණන්ටද අදත්තාදානය අනිෂ්ටවිපාකදාය
කයයි ආගමේ උගන්වාඇතත් ඒ සැබෑනොවෙයි කර්මයෙහි විපාක
යෙක් නැතැයි සිතා සොරකම්කරන්නාහටද යනමොවුන් තුන්දෙ
නාහටම අදත්තාදානය මොහමූලනිදානයෙන් වෙයි යනුයි මෙසේ මේ
අකුසල්මුල්තුණේ නිදානයෙන් මේ සතරඅකුශලය උපදිනබව ටී
කාවේ විස්තර කළබැවින් “තිහිමූලෙහි,, යන්නහාත්පසින්ම ආගම
විරොධබවපෙනේ, අනුරුද්ධාචාරීන්වහන්සේවිසින් ඒ ඒ අකුසලචි
ත්තය ඉපදිමට නිදානවූ නානාක්ෂණිකවූ මුල්තුණ සිතතබා “තිහිමූ
ලෙහි,, කියා රචනාකළනුමුත් විචිකිච්ඡාසහගත උද්ධච්චසහගතදෙසි
තහැර සෙසු දශ අකුසල්සිත්හු ලොභමොහද්වේෂ මොහ යන සම්ප්‍රයුක්
ත හෙතුදෙදෙනෙකුහෙන් යුක්තහයි සිතතබා “තිහිමූලෙහි,,යී ව
රදවා සංස්කාර කරතිබෙන බවදපෙනේ. නුමුත් දෙවමිත්තාස්ථවිරය
න්ගේ ශුද්ධියෙහි “තිමූලෙහි,, කියාකළශුද්ධිය “තිහිමූලෙහි,, යීවියයුතු
වේ“තයොමූලාසමාහටානිමූලා,,යී සමාසවූයේනම් ලොභද්වෙෂ මොහ
යන මුල්තුණමඑක්රැස්ව එකඑකසිතට ඒකක්ෂණයෙහි මූලනිදානවෙ
යි යන දොෂ ප්‍රසඞ්ගයවෙයි. ඒ වළකනුසඳහා “තිහිමූලෙහි,, කියාමවිය
යුතුවත්හැර “චත්තාරිපි,, යනතැන සම්පිණ්ඩනාර්ථයෙහි පිශබ්දයත් ඇ
තිවියයුතුමයි.

25 පිටේ 5 පෙළේ “සහභංගවජ්ජනි,, යනතැනත් “සඞ්ඛ්‍යංවොහාරං
ගච්ඡනි,,කියා පුරාණටීකාවේ අතිබැවින්“සඞ්ඛ්‍යං,,කියාමවියයුතුයි·

එම පිටේ 21 පෙළේ ''අභිජ්ඣ,, ශබ්දය නන්දාරාම තෙරුන්නාන්සේගේ පොතේ සහ ඇතම් බුරුම පොත්හිද ''අභිජ්ඣනං,, යිදක්නාලැබේ. නුමුත් ''අභිජ්ඣං,, යි පුරාණ සිංහල පොත්හිතිබී දෙවමිත්තසථවිරයන්ගේ පොතටගත් ශුද්ධියම මනාගයි හැඟේ.

26 පිටේ 9 පෙළේ ''කාමාවචර පටිසන්ධියා ජවාරගහිතං කම්මනිමිත්තං ගතිනිමිත්තංච පච්චුප්පන්නමතීතමාලම්බනංවා උපලබ්භති'' යන වාක්‍යයෙහි ''වා,, ශබ්දය එකඅකුර නුමුත් අයථානප්‍රයොගයනිසා එයින් පැමිණෙන ආගමවිරොධය අතිශයින්මහත්වේ. ග්‍රන්ථලාඝවය සඳහා සඞ්ක්ෂෙපයෙන්කරණලද්දක්බැවින් මේ වාක්‍යයෙහි ''පඤ්චද්වාරගහිතං කම්මනිමිත්තං පච්චුප්පන්නං'' කියාද ''ජවාරගහිතං අතීතංච'' කියාද ''ඡද්වාරගහිතං ගතිනිමිත්තං පච්චුප්පන්නං'' කියාද ප්‍රත්‍යෙක වාක්‍යයන්ගේ යෙදීමවේ. වාශබ්දය යෙදීමෙන් මෙබඳු නියමයක් නැතුව ඒ අරමුණුතුණින් කෝකක් නුමුත් අරමුණුවනබවහැඟේ. ''ජවාරගහිතන්ති පඤ්චද්වාරගහිතං කම්මනිමිත්තං පච්චුප්පන්නං ජවාරගහිතං අතීතංච ඡද්වාරගහිතං ගතිනිමිත්තං පච්චුප්පන්නමෙව ආලම්බනං ලබ්භතීති යොජනා'' යනු සංඛෙපවණ්ණනායි. මෙහි අවධාරණ එවශබ්දයෙන්ම විකල්ප වාශබ්දය නොයෙදෙනබව පැහැදිලිවේ.

එම පිටේ අන්තිමපෙළේ ''පුනසන්ධි'' යනු නන්දාරාමතෙරුන්ගේ පොතේ ''පුනපටිසන්ධි''යි යෙදීමෙන් ඡන්දස්හානියවූයේය.

37 පිටේ 12 පෙළේ ''චක්ඛුංසොතං'' යන ශබ්දදෙක බුරුමපොත් සමහරෙකද නන්දාරාම තෙරුන්ගේ පොතේද ''චක්ඛුසොතො'' යනාදීන්සංස්කාරකරතිබේ නුමුත් ''චක්ඛුංබොමාගන්ධියරූපාරාමංරූපරතං රූපසමුදිතං,, යනාදිපාලියෙහි ප්‍රථමාවිභක්තිය නිරන්තරාගතව පෙනෙනහෙයින් පුරාණ සිංහලපොත්හි ආක්‍රමයට දෙවමිත්ත සථවිරයන්ගේපොතේ ''චක්ඛුංසොතං,, යනාදීන් කරතිබෙන සංස්කාරයම මැනවැයිහැඟේ.

එමපිටේ 16 පෙළේ ''කබලීකාර,, ශබ්දය අශුද්ධපාඨවශයෙන් හැරදමා ''කබලිංකාර,, කියා හරිගැස්සුනුමුත් ''බහුලීකතා,, යනතැන ''බහුලිංකතායි,, හරිනොගස්වා ''බහුලීකතා,, යි තිබේ ''කබලංකත්වා අජ්ඣොහරියතීති කබලීකාරො,, යනු විභාවිනිටීකායි. බහුලීකත ශබ්ද ධවලීකතශබ්දදියට බින්දුවවූවමනානොවේනම් මෙතනටත් වුවමනානොවේ.

එමපිටේ 27 පෙළේ ''අනිප්ඵන්නාදසාවෙති,, යනතැන වස්ත්‍රාන්තවාචීවූ දසාශබ්දය හැරදමා සංඛ්‍යාවාචීවූ දසශබ්දය යොදගතයුතු මේද්ගිය කුමන ප්‍රයොජනයක් සඳහාවීදැයි නොහැඟේ.

28 පිටේ 16 පෙලේ "ඉතරංඅග්ගාහි කරූපං,, යනු වරදකි. අග්ගාහිකනම්රූපයක් ධම්මසඞ්ගනි රූපකාණ්ඩාදියෙහි නොමැතිසී "ඉතරං හෙ විසතිවිධංඅගොචරග්ගාහිකරූපං ගොචරග්ගහණාභාවතො,, යනු විභාවිනීටීකායි.

30 පිටේ 14 පෙලේ සංසෙදජඔපපාතිකයොනිදෙක්හි රූපකලාපයන්ගේ පහළවීම දක්වනතැන "ඔමකවසෙන පන චක්ඛුසොතඝාණභාවදසකානි පනකදචි පි ලබ්භන්ති,,යි ශුද්ධකරතිබේ. මෙයින් හැඟෙන්නේ ඔමක(පහත්)වශයෙන්චක්‍ෂුඃශ්‍රොත්‍රඝ්‍රාණභාවයනවතුදීශකායකලාතුරකින්ම ලබනබවයි.එසේවිනම් ඒ යොනිදෙකේම එ දශකාගතර නැත්තවුන් වැඩිවියයුතුයි මේපදයට ටීකාව "කදචිනලබ්භන්ති ජච්චන්ධජච්චබධිරජච්චඝාණ නපුංසක ආදිකප්පිකානං වසෙන,, කියාය ජාත්‍යන්ධව උපදිනකල චක්‍ෂුඃ ප්‍රසාදය නැතිවද යනාදින් ඒ ඒ රූපකලාප කලාතුරකින්ම නැතිවනබැවින් "නලබ්භන්ති,, යි වියයුතුයි "නසම්මා තෙසං වසෙන කලාපගා නිවෙදිතබ්බා'ති,, යනපාඨයෙන් මේඅර්ථය ස්ඵුටවේ. මේ එක'න'යන්න කොපමන අනර්ථදායකවීද?මිනිසුන්අතරේ ජාත්‍යන්ධයන් වැඩිද ඇස්ඇත්තවුන් වැඩිදැයි සෙවියයුතුයි

එම පිටේ 26 පෙලේ "තතොපරං චිත්තජාහාරරූපඤ්ච වොච්ඡිජ්ජති,, යන්නෙන් චිත්තජරූපකලාපසඞ්ගහා එකම ආහාරරූපයක්මිස සියළු ආහාරජ රූප නොගැනේ. "තතොපරංචිත්තජාහාරජරූපඤ්ච වොච්ඡිජ්ජන්ති අජ්ඣත්තසන්තානෙ තෙසං උප්පත්තියා අභාවතො යථානිබ්බත්තංචිත්තජං ආහාරජඤ්ච තතො පරංකිඤ්චිකාලං පවත්තිත්වා නිරුජ්ඣති,, යනු විභාවිනීටීකායි. ආහාරරූපනම් ඔජසංඛ්‍යාතවූ එකමරූපයකි ආහාරජරූපනම්'ශුද්ධාෂ්ටකලඝුතාදෙකාදශක,යනරූපඑකුන්විස්සකි එක'ජ,යන්න අඩුවීමෙන්රූපදහනවයක් එකවරටම අඩුවුනා නොපෙනේද?

එමපිටේ 27 පෙලේ "තතොපරං උතුසමුට්ඨාන පරම්පරාව,, යන්න "තතොපරං උතුසමුට්ඨානරූපපරම්පරායාව,, කියාවියයුතුයි.

33 පිටේ 5 පෙලේ "අත්තවාදෙහිච,, යන්න "අත්තවාදුපාදානංතිච,, කියාවියයුතුයි. මේපදයට ටීකාලියන සුමඞ්ගලමහාස්වාමිපාදයෝ "බන්ධව්‍යතිරිත්තාව්‍යතිරිත්තවසෙන වීසති පරිකප්පිතස්ස අත්තනො වාදෙ'අත්තවාදෙ සොයෙව උපාදානන්ති අත්තවාදුපාදානං,,යී කීග ස්කන්ධයන්නේ,'අඩුවැඩිවීම්වශයෙන් විසිආකාරයකින් කල්පනාකරණලදනෙවත් රූපාදි පස්කඳපස්පස්ආකාරයකින්සිතනලදවිංශත්සත්කායදෘෂ්ටියට ආත්මවාදයන නමෙකි. ඒ සත්කායදෘෂ්ටිය ලංකොට ගැන්ම "අත්තවාදුපාදන,, වෙයී කියේයි. අත්තවාදයයි සාමාන්‍යයෙන් කීවොත් සත්කායදෘෂ්ටියමිස තත්ප්‍රතිබද්ධ තෘෂ්ණාසංඛ්‍යාත උපාදානය නොගැණේ.

එමපිටේ 7 පෙලේ 'උපාදනා දුවෙවුත්තා,, යනමෙහි "වුත්තා,, යන්න අශුඛපාඨයකි හැර "ධම්මා"යි සංස්කාරකිරිමත් අයුතුයි. "තථාඋපාදනාදුවෙවුත්තා තණ්හාදිසීවසෙන,, යනු විභාවිනිටිකායි.

34 පිටේ 13 පෙලේ "බොධපක්ඛියසඟහෙ,, යන්නෙහි "බොධි,, වියයුතුයි "බුජ්ඣතීතිබොධි,, යන විභාවිනි ටිකාපාඨයෙන්හා "බුජ්ඣතිසච්චානි එතායධම්මසාමග්ගියාතිබොධි,, යන පුරාණ ටිකාපාඨයෙන්ද "බොධිවුච්චතිඤාණං,, යන අටුවාපාඨයෙන්ද ඉප්‍රත්‍යවශයෙන් "බොධි,, කියාම යෙදෙනබවපෙනේ.

35 පිටේ 26 පෙලේ "මනොධාතු ධම්මධාතු මනොවිඤ්ඤාණධාතු" යනපාඨය නානූරාමස්ථවිරයන්ගේ පොතේසහ බොහෝසෙයින් බුරුමසියම් සිංහල පොත්හිද "මනොධාතු මනොවිඤ්ඤාණධාතු ධම්මධාතු"යි යොදනිබේ.මනොධාතු නම් පඤ්චාරාවජ්ජනය ව්‍යවස්ථාපනවශයෙන මනොධාතු ත්‍රිකයයි. මනොවිඤ්ඤාණධාතු නම් දෙපස්විඤ්ඤාණයෙන්හා මනොධාතු ත්‍රිකයෙන්ද අවශෙෂවූ සියලු විත්තයෝයි. ධම්මධාතු නම් ප්‍රශාද සුඛුමරූපාදිධර්මසමූහෂට්කයයි.මේතුන්වැදූරුම්ධර්මයන් පටිපාටිවශයෙන් තබනකල්හි මනොධාතුවට මනොවිඤ්ඤාණධාතුව ආසන්නබැවින් ඒදෙක ක්‍රමයෙන් යොදා ධර්මධාතුව අගටයෙදිම යුතුයයි සලකා අපටදකින්ටලැබුනු පොත් සියගණනක මේ ක්‍රමයට යොතිබේ. "තදනන්තරං පවත්තිකභාවෙන මනොධාතුවුත්තා තදනන්තරං ජවනිකජ්ඣවාරිකාලම්බනභාවෙනධම්මධාතුවුත්තාමනොවිඤ්ඤාණධාතු පනජවනිකාලම්බනභාවෙන අවසානෙවුත්තා" යනසංඛෙපවණ්නාටිකාපාඨයෙන් ධර්මධාතුව මධ්‍යයෙහි යෙදිම අනුරූධාචාර්යයින්වහන්සේගේම යෙදිමබවපෙනේ. පුරාතන ලංකාවේ අභිධර්ම මනාසේඋගත් පඬිතයන්ගේ පොත්වල තිබිහිය සමහර ශුඛපාඨගැණසනුතිකටයුතුයි. නුමුත් මේ දෙවමිත්තස්ථවිරයන්ගේ සංස්කාරයක් නොවේ.

එමපිටේ 27 පෙලපටන් "දුක්ඛසමුදයං අරියසච්චං දුක්ඛනිරොධංඅරියසච්චං" යනපාඨයෙහි "සමුදය–නිරොධ"ශබ්දදෙක විශෙෂ්‍යයාගේ ලිඞ්ගානුවර්තනයකෙරෙතියි සිතා "සමුදයං නිරොධං"යි නපුංසකලිඞ්ගවෙන් යෙදිම සාවද්‍යයි විශෙෂ්‍යයාගේලිඞ්ගයවිශෙෂණයට ලැබෙන්නේ බොහෝසෙයින් තුල්‍යාධිකරණයෙහි පමණකි මෙහිභින්නාධිකරණබැවින් ඒ යුක්තියනොයෙදේ ඊට උදාහරණය "දුක්ඛනිරොධගාමිනි පටිපදා අරියසච්චං,, යනතැන"ගාමිනිං– පටිපදං,,යිනොවි විශෙෂණය ස්වකියලිඞ්ගයෙන්ම සිටිමයි "සමුදෙති එතස්මාදුක්ඛන්ති කත්වා දුක්ඛස්ස සමුදයො දුක්ඛසමුදයො දුක්ඛස්ස අනුප්පාදනිරොධො එත්ථඑතෙනාතිවා දුක්ඛනිරොධො" යනවිභාවිනි ටිකාපාඨයෙනුත් සැකහැරගතයුතු.

[illegible]

36 පිටේ 9 පෙළේ "මග්ගයුත්තාඵලංචෙව" යන්න ඤාණාරාමතෙරුන්ගේ පොතේ සහ බුරුමසියම් සිංහල බොහෝපොත්හි "මග්ගයුත්තා ඵලා,, යි දක්නාලැබේ· මෙහි භාවය මාගිසිනහාණයදුනු සම්මාදිට්ඨිආදි අටමාගිසත්‍යවශයෙන් ගත්කල ඉතුරුවූ චිත්තයද තත්සම්ප්‍රයුක්ත ස්පර්ශාදිසියලුචෛතසිකද සසම්ප්‍රයුක්තඵලසිතද චතුරාර්‍ය්‍යසත්‍යයෙන්බැහැරවූ ධර්මයෝයකියායි. ඵලශබ්දයනියතනපුංසකලිඟුබැවින්බහුවචන කටයුතුනම් "ඵලානි,,කියාමුත්'ඵලා, කියාසිඩනොවේ "මග්ගයුත්තා අඞ්ගිකවිනිම්මුත්තා සෙසාමග්ගසම්පයුත්තා ඵස්සාදයො ඵලඤ්චෙව සසම්පයුත්තන්ති එතෙචතුහිසච්චෙහි විනිස්සටා විනිග්ගතානිපරියායතො,, යනු විභාවිනිටීකායි·

38 පිටේ 2 පෙළේ "පඤ්ඤානනයො,,යනපාඨයහැරදමා'පඤ්ඤාතපාඨො, යි යෙදිමවරදයි මේ ප්‍රකරණයෙහි "පටිච්චසමුප්පාදනයො පඤ්ඤානනයොචෙති,, යනු උද්දෙසයි "පඤ්ඤානනයොපන ආහච්චපච්චයඨිති,, යනු නිද්දෙසයි. "අයමෙත්ථපඤ්ඤානනයො,, යනුපටිනිද්දෙසයි. උද්දෙසනිද්දෙස ෆදක්හි ආක්‍රමය පටිනිද්දෙසයෙහි හැරදමා "පඤ්ඤානපාඨො,, යි හරිහැස්විම සාවද්‍යයි· "ඉද්‍රනිපඤ්ඤානනයං දස්සෙතුං හෙතුපච්චයොත්‍යාදිවුත්තං,, යනවිභාවිනී ටීකාපාඨයෙන් ඒයෙදිම හාත්පසින් වරදබව දතයුතුයි. මේ ප්‍රකරණය සප්තප්‍රකරණයෙහි උක්ත අභිධර්මාර්ථයන් සඞ්ග්‍රහකළ ප්‍රකරණයක්වාමිස ඒ ඒ පොත්වල පාඨ උඟුළා සංග්‍රහකළ ප්‍රකරණයක් නොවනබවදතයුතුයි.

එමපිටේ 14 පෙළේ "හෙතුජ්ඣානමග්ගහානි" යන්නෙහි "ඣානඟ" යන්න "ඣාන" කියායෙදුවා අනුචිතයි මෙහිඅර්ථය හෙතුසහධ්‍යානාඟමාගීාඟයෝය කියායි·අඟයෙදූ අඟශබ්දග ප්‍රත්‍යෙකවශයෙන් . සියලු ශබ්දනාසඹන්ධ කරන්ටනිසාත්'හෙත්වඟඣානඟමග්ගඟ,කියාගතයුතුහෙයින් එසේත් නොයෙදේධ්‍යානාඟයනුවිතර්කාදිපසයි ධ්‍යානයනු ධ්‍යානචිත්තසම්ප්‍රයුක්ත සමාධියයි ඉතින් අඟශබ්දග නොයෙදිමෙන් කොතරම් මහත් අර්ථවෛපරිත්‍යයක්විද්‍යයි සලකනු මැනවි "හෙතුඣානඟමග්ගඟානි සහජාතානංනාමරූපානන්ති තයොපෙතෙපටිසන්ධියංකම්මසමුට්ඨානානං" යනාදි විභාවිනීපාඨයෙන් සැකහැරගතයුතු.

40 පිටේ 16 පෙළේ "භූතපරිණාමාකාරමුපාදය" යන්න ඤාණාරාමතෙරුන්ගේපොතේ සහ ඇතම් අත්පොත්වලත් "භූතවිපරිණාමාකාරං" යි දක්නාලැබේ· නුමුත් මෙතන "පරිණාමාකාර,, ශබ්දය යුක්ති යුක්තයි "පඨවාදිකානංමහාභූතානං පබන්ධවසෙනපවත්තමානපත්ථටසඞ්ඝාතාදි ආකාරෙන පරිණාමාකාරං පරිණතභාවසංඛාතං ආකාරං උපාදය" යනාදි විභාවිනීටීකාපාඨයෙන් මහාභූතයන්ගේපෙරළිම නොවම්හිකිරිම මෙතනට උචිතවූ අර්ථයබවහැගේ. "කම්මපච්චයඋතුසම්භූතං පත්ථටඝටනාදිභෙදං තංතං·පරිණාමං ආකාරං,, යන පුරාණටීකාපාඨයෙනුත් මිහිඤ්රිමම ඔප්පුවේමැයි.

එම පිටේ 18 පෙළේ "ගෙහරථසකටාදිකා,, යන පුරාණ පාඨය අශුද්ධබවටහැර "රථසකටාදිකා,, යි ශුද්ධකරතිබේ "සම්භාරසන්නිවෙසා කාරන්ති දරුමත්තිකාතන්තාදීනං සම්භාරානං උපකරණානං,, යන විභාවිනීටීකාපාඨයෙන් ගෙහශබ්දය අනුරුද්ධාචාරීන්වහන්සේගේම යෙදීමබව හැඟේ කණුදඬුමැටිවැල්යන සම්භාරයන්ගෙන් ගෙයක් මිස රථසකටාදිය නොසාදනබව හැඟේ.

43 පිටේ 23 පෙළේ "දුතියජ්ඣානාදයොයථා රහමප්පෙන්ති,,යන්නෙහි ක්‍රියාව එකවචනයෙන් නොව බහුවචනයෙන් වියයුතුයි

එම පිටේ 31 පෙළේ "පඨමාරුප්පවිඤ්ඤාණභාවං,, යන්න "තමෙව පඨමාරුප්පවිඤ්ඤාණාභාවං,, යිවියයුතුයි. මේ අරූපධ්‍යානසතර එකවෙක සම්බන්ධයි අනන්තාකාශ අරමුණෙහි පළමුවන අරූපධ්‍යානය උපදී එම අරූපධ්‍යානසිත අනන්තවශයෙන් භාවනාකිරීමෙන් විතියාරූපධ්‍යානය උපදී එම පළමුවන අරූපධ්‍යානසිත්හුගේ නත්ථිභාවප්‍රඥප්තියෙහි භාවනාවැඩීමෙන් තුන්වෙනි අරූපධ්‍යානය උපදී එම තුන්වන ධ්‍යානය ශාන්තයයි භාවනාවඩන්නාහට සතරවන අරූපධ්‍යානය උපදී. මෙසේමේ සතර ඔවුනොවුන් සම්බන්ධබැවින් අතරින්පතරින් යම් ධ්‍යානයක් ඉපදවියනොහේ පළමුවන අරූපධ්‍යානය අනන්තවශයෙන් සලකා දෙවනධ්‍යානයත් එමධ්‍යානයම කිසිවක් නැතැයි සලකා තුන්වනධ්‍යානයත් ඉපදවියයුතුහෙයින් "තමෙව" යන්නහා "විඤ්ඤාණාභාවං"යි අභාවශබ්දයත් ඇතුවමවියයුතුයි.

45 පිටේ 1 පෙළේ "ලක්ඛණරසපච්චුපට්ඨාන වසෙන" යන්න විශුද්ධිමාර්ගාදියේආ "පදට්ඨානය" බලාගෙණ "ලක්ඛණරස පච්චුපට්ඨාන (පදට්ඨාන) වසෙන"යි නාණාරාම තෙරුන්ගේ සහ සිංහල බුරුම බොහෝ පොත්හි සකස්කරතිබේ නුමුත් මෙතනට හෙවත් මේ දිට්ඨිවිශුද්ධියට "පදට්ඨානය" යිකියනලද ආසන්න ධර්මයන්ගේ මෙනෙහිකිරීමෙක් නැත මෙහිදී ධර්මයන්ගේ සාමාන්‍ය ස්වභාව නම්වූ ලක්ෂණයද කෘත්‍ය සම්පත්තිනම්වූ රසයද පච්චුපට්ඨානනම්වූ ඵලයද යන ත්‍රිවිධධර්මයන්ගේ සම්මර්ශණය පමණක් කරන්නේයි එහෙයින් විභාවිනීටීකාවේ "ධම්මානං සාමඤ්ඤසභාවො ලක්ඛණං කිච්චසම්පත්තියොරසො උපට්ඨානාකාරොඵලංව පච්චුපට්ඨානන්ති එවංවුත්තානං ලක්ඛණාදීනං" යනුහා පුරාණටීකාවේ "එවංවුත්තානංලක්ඛණරසපච්චුපට්ඨානානංවසෙන" යනුදක්තිහයි දතයුතු එහෙයින් සිංහල පුරාණ පොත්හි තිබි දෙවමිත්‍රස්ථවිරයන්ගේපොතට ගත්පාඨයම ශුද්ධයි.

එම පිටේ 27 පෙළේ "යාසිඛාප්පත්තාසානුලොමා සංඛාරුපෙක්ඛාවුට්ඨානගාමිනී විපස්සනාති" යනවාක්‍යයෙහි විරුද්ධ සංස්කාරයක් පෙනේ පුරාණ තිබීගිය "සාසානුලොමා" යනපදය අශුද්ධපාඨයයිසිතා යටදමා තිබේ. අනියමාර්ථවූ යශබ්දයයෙදූවානම් බෙහෙවින්ම නියමාර්ථ සශබ්දය

ත් යෙදිම යුක්තියකි.මෙහි භාවය අනුලොමඤානයෙන් යුක්තවූ මුදුන්
පත්යම් විදර්ශනාවක්විද ඒ විදර්ශනාතොමෝම සංස්කාරයන්කෙරෙහි
මැදහත්බැවින් “සංඛාරුපෙක්ඛා” දවේ.අපායාදීන් ගොඩනඟිනහෙයි
න්ද මාර්ගයටපැමිණෙනහෙයින්ද වුට්ඨානගාමිනී විදර්ශණායයිදකියනුලැ
බේයයනුයි.මේකියන්නේ පරිකම්1උපචාර2අනුලොම3ගොත්‍රභූ4මාර්ග5
ඵල6ඵල7යනසප්තජවනයෙන්යුක්තවීථියෙහිගොත්‍රභූසිතහාඑක්වයෙ
දුනුප්‍රඥචෛතසිකයයි ප්‍රඥවටවිදර්ශනායතනාමයලැබෙන්නේමෙහිදිය
“අනුලොම ඤාණසහිතතාය සානුලොමා සාඑව සංඛාරෙසු උදාසීන
තතාසංඛාරුපෙක්ඛා” යනාදි විභාවිනිටිකාපාඨයෙන් සැකහළයුතුයි·

එමපිටේ 23 පෙලේ “ඉදානි අප්පනාඋප්පජ්ජතීති” යන වර්තමානක්‍රි
යාව“ඉදානිඅප්පනාඋප්පජ්ජිස්සතිති”යි අනාගතක්‍රියාවෙන්ම සියළුපො
ත්හි ආනයින් ශුද්ධයි “ඉදානි අප්පනාඋප්පජ්ජිස්සතීති ඉදානිඅප්පනාසං
ඛාතො ලොකුත්තරමග්ගොඋප්පජ්ජිස්සතිති වත්තබ්බක්ඛණෙ” යනවි
භාවිනීපාඨයෙන්ම ක්‍රියාව කවරකාලිකදැයි හැගේ පරිකර්මාදි සිත්වත්
උපදින්නට මත්තෙන් අර්පණානම් මාර්ගසිත කොයින් උපදිද?

47 පිටේ 18 පෙලේ “තථාඵලචමමග්ගාවගමනභාවනාවසෙන මග්ග
වීථියං” යනවාක්‍යය කවරඅර්ථයක් සඳහා මෙසේ සකස්කලේදැයිනො
හැගේ එහි ශුද්ධපාඨය“තථාඵලවමග්ගාගමනවසෙනමග්ගවීථියං” කියා
වේ. මේවාක්‍යයෙහි මීටමුලින් “මග්ගාවිපස්සනාගමනවසෙන තිණි
නාමානි ලභති” යන්න බැලියයුතුයි මාර්ගසිතටමුලින් උපදනා ගො
ත්‍රභූසිතනායෙදුනු ප්‍රඥව ‘වුට්ඨානගාමිනී විදර්ශනා,යි ඒවිදර්ශනාතොමෝ
අනාත්මවශයෙන් සංස්කාරයන් දකිනම් සුඤ්ඤතානු පස්සනාවිමො
ක්ෂමුඛයයි ඒවිදර්ශනා ප්‍රඥවටනමෙකි.ඒ විදර්ශනාවමඅනිත්‍යයෙහි නිත්‍ය
යයනාදින් පැවැති විපරිතනිමිත්තට විරුද්ධව සංස්කාරයන් දකිනම්
අනිමිත්තානුපස්සනා විමොක්ෂමුඛයයිනම්වේ ඒ විදර්ශනාවම තෘෂ්ණා
ප්‍රණිධිය(පැතිම)ටවිරුද්ධාකාරයෙන්සංස්කාරයන්දකිනම්අප්පණිහිතා
නුපස්සනාවිමොක්ෂමුඛනම්වේමේවිදර්ශණාවමින්මතුඋපදනාමාර්ගසිත
ට දොරකඩක්වැනි බැවින් විමොක්ෂමුඛයයිදු කියති මේ ගොත්‍රභූසිත
පුද්ගල ධ්‍යාසයවශයෙන් ඒනම්තුණ ලබනබැවින් ඊලඟට උපදනා
මාර්ගයද විදර්ශනාවගේලැබීමේඇටියට සුඤ්ඤතවිමොක්ෂය අනිමිත්තවි
මොක්ෂය අප්පණිහිතවිමොක්ෂය යන නම්ලබයි ඒ ඒ මාර්ගසිතට අන
තුරුව උපදනා අකාලිකඵලය ආනන්තරිකසමාධිය යනාදිනම්ඇති
ඵලචිත්තයද ඒවිදර්ශනාවගේ නමින්ම සුඤ්ඤතඵලයයනාදිනම්ලබයි ඉ
තින් “මග්ගාවගමනභාවනාවසෙන” යන සංස්කාරයකුමණ යුක්තිය
ක් සඳහා කරණලදදැයි නොහැගේ·

39 පිටේ 28 වෙනි 29 වෙනි පේළිවල මහත් ආකුලයක්වීනිබේ.“ඛ
ඤානානි තඛණෙවත්‍ථුවිපාකානං (සහජාතවසෙන) චිත්තචෙතසිකාධ
ම්මාසහජාතරූපානං සහජාතවසෙන” යනමෙහි “සහජාතවසෙන,,ය
නපදය දෙතැනකයෙදීම් මහත් විපරිතයක්බැවින් ( ) මේලකුණෙ
න්මැදිකරතිබෙනපදය දුරු කටයුතුයි “පුරෙජාතස්සඉමස්සකායස්ස
පච්ඡාජාතවසෙන,, යන්නෙහි අශුඩපාඨවශයෙන්හැරදමාතිබෙන“ප
ච්ඡාජාතාචිත්තචෙතසිකාධම්මා,, යනවාක්‍යය මුලටයොදගතයුතුයිමේ
විප්පයුත්තප්‍රත්‍යයේ“චිත්තචෙතසිකාධම්මා,, “පච්ඡාජාතාචිත්තචෙතසි
කා ධම්මා,,“ජවත්‍යුනි,, යන මේධර්මතුණ තුන්වැදුරුම්ප්‍රත්‍යයධර්මදක්
වීමටද “සහජාතවසෙන,,“පච්ඡාජාතවසෙන,,“පුරෙජාතවසෙන,,යන
පදත්‍රය ප්‍රත්‍යයවනසැටි දැක්වීමටද කියේය·එහෙයින්මේශුඩියගාත්ප
සින්මආධුනිකයන්ගේමුලාවට හෙතුවනබවපෙනේ.


45 පිටේ 10 වෙනි 11 වෙනි පේළිවල කරනිබෙන ආකුල ශුඩිය මහත්
උත්සාහයකින් නිරාකුලකටයුතුයි “තෙසංචව පච්චයවසෙන(ලක්)
ඛණවසෙනච (පච)උදයව්‍යයඤාණෙන(දස)උදයව්‍යයමනුපස්සනතස්
සච”යනවාක්‍යයෙහි ( ) මේ රෙඛාවයට මැදන්බෙන සියලුපදයන්වැඩි
පුරයොදනිබේ මෙසේවීමටහෙතුවලිපිදෙෂාකුලසන්නයක් පමණක්ප
හිටකොටගෙණ හාවයනොතේරිමේශුඩිය කිරිමයතිහැගේ“සම්මසන
ඤාණෙ පනඋප්පන්නෙ පුනතෙසංචවසංඛාරෙසු අවිජ්ජා–පෙ–පච්චයස
මුදයවසෙන පච්චයනිරොධවසෙනච පච්චයෙ අනාමසිත්වා පච්චුප්ප
න්නඛන්ධෙසු නිබ්බත්තිලක්ඛණමත්තස්ස විපරිණාමලක්ඛණ ම
ත්තස්සච දස්සනෙන ඛණවසෙනචාති එකෙකස්මිංඛන්ධෙ පච්චයවසෙ
න චතුධා ඛණවසෙන එකධාචාති පචධා උදයං පචධාවයන්ති දසදස
උදයබ්බයදස්සනවසෙන සමපඤ්ඤාසාකාරෙහි උදයබ්බයඤාණෙන උද
යබ්බයං සමනුපස්සන්තස්ස,, ගනු විභාවිනීපාඨයි.සංස්කාරයන් ප්‍රඥාග
ඤායෙන් පිරිමැදබලන සම්මශීණඥනය උපන්නාටපසු එමසංස්කාරය
න් අතුරෙන් අවිද්‍යාතෘෂ්ණා කර්ම ආහාරයන සතර ධර්මයන්ගේ පහල
වීමෙන් රූපය පහලවෙයි එසේම ඒ ධර්මසතර නිරුඩකිරිමෙන් රූපය
නිරුඩවෙයි අවිද්‍යාතෘෂ්ණාකර්මස්පර්ශ යනසතරධර්මයන්ගේ පහලවීමෙ
න් වෙදනාසංඥසංස්කාරයන්ගේ පහලවීමවෙයි ඒධර්මයන්ගේම නැති
කිරිමෙන් ඒ ස්කන්ධත්‍රය නිරුඩවෙයි අවිද්‍යාතෘෂ්ණා කර්ම නාමරූප ය
න ධර්මචතුෂ්කය පහලවීමෙන් විඥනස්කන්ධය පහලවෙයි එම ධර්මයන්
ගේ නැතිකිරිමෙන් විඥනස්කන්ධය නැතිවෙයි මෙසේ සතර ප්‍රත්‍යයන්
ගේ පහලවීම් නිරුඩවීම්වශයෙන්ද ඒප්‍රත්‍යයන් නොගෙණ මේ පවත්
නා පස්කදෙහි උත්පත්තිලක්ෂණ මාත්‍රයහා විපරිණාමලක්ෂණ මාත්‍රය

ද දුක්මෙන් ක්ෂණවශයෙන්දැයි මෙසේ එකෙකි කදෙහි සතරප්‍රත්‍යයව ශයෙන් සතරාකාරයක්ද ක්ෂණවශයෙන් එකආකාරයක්දැයි යන පස් ආකාරයකින් පහළවීමය පස්ආකාරයකින් විනාශයදැයියන එකඑකක දෙහි දසදසලදයව්‍යයත් දුක්ඛිමිවශයෙන් සමපණස් ආකාරයකින් දුක්ඛමයයි කියනලද උදයව්‍යය ඥාණයෙන් උත්පත්තිවිනාශය සිහිකරන්නාහටයයන අදහසයි. මේහාවය දැක්වීමෙදී සන්නකතෘවිසින්යොදනලද ''පච-දස,, ශබ්දාදිය පෙලපොතටයෙදිමත් ක්ෂණ ශබ්දය අව්‍යක්තලිපිකරුවෙකු විසින්''ලක්ෂණ''කියා ලියාතිබ්බාදැක ඒ පිළිගෙණ පෙලපොතටයෙදිමත් බලවත් දෝෂයකි. මේපචදසශබ්දවයහා ''ලක්ඛණ''ශබ්දයත්මෙසේයෙදීමෙන් මේපොතහාත්පසින්ම ආකුලවීගියේයි'

46 පිටේ 11 වෙනි පෙළේපටන් (විමොක්ඛමුඛං) දුක්ඛානුපස්සනා තණ්හාපණිධිං මුචනති අප්පණිහිතානුපස්සනානාම (විමොක්ඛමුඛං) (යස්මා) යදිවුඨානගාමිනී විපස්සනා අනත්තතො විපස්සති සුඤ්ඤතොවිමොක්ඛොනාමහොති මග්ගොයදිඅනිච්චතො විපස්සති අනිමිත්තොවිමොක්ඛොනාම යදිදුක්ඛතො විපස්සති (මග්ගො) අප්පණිහිතො විමොක්ඛොනාමාතිව,,යනපාඨයෙහි වක්‍රරේඛාවයට මැදිවූ''විමොක්ඛමුඛං,,යනදෙතැනක්හා ''මග්ගො,,යන එකතැනක්ද අධිකව තිබේ·ඇරත්''යස්මා,,යනුත්''තස්මා,,වියයුතුයි.විමොක්ඛමුඛශබ්දය මුල යෙදුබැවින් සෙසුදෙතැනට අධ්‍යාහාරවේ''මග්ගො'' යන්න හාත්පසින්ම නිරර්ථකයි. ටීකාවටසමකර බැළුවොත් එබව වැටහේමැයි. ස්වල්ප දෝෂයන්ගෙන් අර්ථහානියට බාධානොවනනුමුත් මේදැක්වූ සියලුතැන්ම අදහස්වෛපරීත්‍යයට හෙතුවනබැවින් ආධුනිකයන්විසින් සිහිනුව නිත්යෙද් සකස්කරගැණිමෙන්අභිධර්මසප්තප්‍රකරණාගතසියලු පරමාර්ථ ධර්මයන් සංක්ෂෙපයෙන් සංග්‍රහකරණලද ග්‍රන්ථවශයෙන් ඉතාස්වල්ප වුවත් අර්ථවශයෙන් ඉතාබහුලවූ සියලු ආභිධර්මිකාචාර්‍ය්‍යවරයන්ගේ හක්තසාරවසූපමවූ මේ ආභිධර්මාර්ථසංග්‍රහනැමති පරමාර්ථධර්මශාස්ත්‍රජලවාරුඩව සප්තප්‍රකරණාන්තගීනවූ අභිධර්මමහොදධිය එතරකොට නාමරූපධර්මයන් ව්‍යවස්ථාකොට චතුරාර්‍ය්‍යසත්‍යප්‍රතිවෙධය අනායාසයෙන් සිද්ධකරගන්ට උත්සාහකටයුතු—

සිද්ධිරස්තු.

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු